For private circulation only

THE WAND

ORGAN OF THE SRI LANKA MAGIC CIRCLE

The Official Guardian of Magic

January 2018

# Magic Dealer from Hydrebad Ashok Kumar will be there at the next meeting.



## මැජික් බඩු අලවිය

ලබන රැස්වීමදා



**NEXT MEMBERS DAY SUNDAY 28th January** ලබන රැස්වීම 28 වන ඉරිදා

Edited by Devsiri Fernando 7 Francisco Place, Moratuwa Tel: 2645927

# Your Audience is Always Right !

(ඔබේ ප්‍රේක්ෂකයා සැමවිටම නිවැරදියි!) මැයෙන් පසුගිය කලාපයක පළවූ Stuart Bowie ගේ ලිපියේ සිංහල අදහස සාමාජික ඉල්ලීම මත මෙසේ ඉදිරිපත් කරමු.

## ඔබේ ප්‍රේක්ෂකයන් හඳුනාගන්න

බොහෝ අවස්ථා වල දී මැජික් දර්ශනයක් නැරඹීමට ජනයා එක්වන්නේ කැමැත්තෙනි. විනෝද වීමේ අරමුණ ඇතිවය.. නමුත් සැම විටම එය එසේ නොවේ. තරු හෝටලයක භෝජනගාරයකදී හෝ මංගල උත්සවයක භෝජන සාදයකදී ප්‍රේක්ෂකයා වෙත ගොස් සමීප මැජික් දක්වන අවස්ථාවක Table to table magic performance(Roaming magician) මේ තත්වය වෙනස් විය හැක. ඔවුන් එහි පැමිණෙන්නේ වෙනත් කටයුත්තකටය. මැජික් ශිල්පියෙකු එහි සිටීම අහඹුවකි. මැජික් ශිල්පියා මේසයක වාඩිවී සිටින කණ්ඩායමක් අතරට ගොස් " Hello' I am the Magician" (මැජික් එකක් බලමුද?) යනුවෙන් තමාව හඳුන්වා දීමේදී ලැබෙන ප්‍රතිචාර විවිධාකාර විය හැකී

මොවුන් අතර විවිධ මානසිකත්ව ඇති අය වෙති. 'මැජික් වලට ආදරය කරන්නෝ (Magic Lovers) සහ 'මැජික් පිළිකුල් කරන්නෝ(Magic Haters) සහ තවත් වෛවාරන්න කොටස් ඒ අතර වෙති. ඒ අය අසලටම ගොස් කතා බස් කරමින් මැජික් දැක්වීම පහසු කටයුත්තක් ම නොවේ. මෙම වර්ග හඳුනාගැනීම ඔබේ කාරිය කරගෙන යාමට පහසුවකි. 'සැබවින්ම මැජික් පිළිකුල් කරන්නන් (True Magic Haters - T'M'H') හට මැජික් 'අරහං යී; මැජික් ශිල්පීහු 'අරහං ය; මැජික් සම්බන්ධ සියළු දේ 'අරහංය ඔවුනට මැජික් පිළිබඳව උනන්දුවක් ඇතිකරවීමට උත්සාහ ගැනීම කාලය අපතේ යැවීමකි. එය කළ නොහැක. අත්හරින්න ඔවුන්. එවැන්නන් සිටීම ඔබට වාසියකි. එක් මේසයක දර්ශනයක් අඩු වීමකී

'බොරුවට මැජික් පිළිකුල් කරන්නෝී (Pseudo Magic Haters - P'M'H') ද සිටී. 'මැජික් එකක් බලමුදැයී ඔබ විමසූ විට, එය අනවශ්‍ය බව ඔවුහු අඟවති. ඔවුන් මැජික් පිළිබඳව උපහාසයෙන් බලන්නේ මැජික් මගින් වින්දනයක් ලැබීම නුහුරු නිසා විය හැක. ඔබේ ඉදිරිපත් කිරීම් ඔවුන් දැක නොමැති නිසා විය හැක. මැජික් පිළිබඳව උනන්දුව ඔවුන් තුල ගොඩනැංවීම ඔබේ කාරියයි. සිත් ගන්නා සුළු එක් අංගයක් ඉදිරිපත් කරන්න. එවිටත් උනන්දුවක් නොදක්වන්නේ නම් ස්තුති කර එතැනින් ඉවත් වන්න. සමහරවිට ඔවුන් තව තවත් මැජික් ඔබෙන් ඉල්ලා සිටිනු ඇත. 'බොරුවට මැජික් පිළිකුල් කරන්නෝ, 'මැජික් වලට ආදරය කරන්නෝී බවට පත් කිරීමට ඔබට අවස්ථාවක් ඇතී

එකිනෙකා තුරුළු වී පෙම්බස් දොඩමින් සිටින ආදරවන්තයෝ (True Lovers -T.L.) දුරදීම හඳුනා ගතහැකි තවත් කොටසකි. ඔවුන්ගේ ආදරය 'මැජිකී වෙත නොවේ. එකිනෙකා වෙතය. ආහර හෝ වෙනත් යමක් ඔවුනට අනවශ්‍යය. කාර්ය බහුලය ඔවුනට මැජික් බැලීමට කාලයක් නොමැත. අවශ්‍ය තාවයක් ද නොමැත. සිනහවකින් සංග්‍රහ කර සුභ පතන්න. වෙනත් මේසයක් වෙත යන්න. ඔබ පැමිණි බව හෝ ආපසු ගිය බව ඔවුන් නොදැකීමට ඇති ඉඩකඩ ද වැඩිය. එකිනෙකා සමග උසුළු විසුළු කරමින් එම මොහොත රසවිඳින කණ්ඩායමක් හෝ ගැඹුරු සාකච්ඡාවක යෙදෙමින් කාලය ප්‍රයෝජනයට ගන්නා කණ්ඩායමක් මගහැර යාම හිතකරය. ඔවුනට බාධා කිරීම එතරම් ආචාර ශීලි ක්‍රියාවක් නොවේ. ඔවුන් ඔබට ආරාධනා කළහොත් මිස ඔවුන් වෙත නොයන්න. 'සියල්ල දත් විද්‍යාඥයන් (Pseudo Scientists - P'S') යයි කැපී පෙනෙන්නට උත්සාහ කරන කොටස මම පිළිකුල් කරමි. ඔවුහු දකින දේ තුලින් වින්දනයක් ලබාගැනීමට නුහුරු අමන රැලකි. "ඕක මගේ අතේ තියෙද්දී නැති කරන්න පුලුවන්ද", "ඔයාගේ අත් දෙක බැඳලා තිබුනොත් ඕක කරන්න පුලුවන්ද?" "ඔයාගේ සාක්කුව මට බලන්න පුලුවන්ද?" ආදී ගොන් ප්‍රශ්න අසමින් ස්වයං වින්දනයක් ලැබීමට ඔවුන් වඩා කැමතිය. ශේක්ස්පියර් නාට්‍යයක දී 'හැම්ලට්ී චරිතය රඟපාන නළුවා අමතා "ඔයා ඇත්තම හැම්ලට් නම් මට හැම්ලට් ගේ උප්පැන්න සහතිකය පෙන්නන පුළුවන්ද?" ඇසීම වැනි මෝඩකමකි ඒ. ඔවුන් සමග කතාවට නොයන්න. ඔවුනට කිසිසේත් සිතාගත නොහැකි අංගයක් පෙන්වන්න. "මැජික් කියන්නේ ඇස්බැන්දුම්....." "මෙතන කෙරෙන්නේ විනෝදය සපයන පොඩි රඟපෑමක්....." කියා එතැනින් ඉවත් වන්න. මැජික් ශිල්පියෙකු ලෙස මා අකමැතිම කොටස Smart Alec Kid(SAK)ය. බොහොම බුද්ධිමත් යයි දෙමාපියන් විසින් අනවශ්‍ය ලෙස ඔලුව උදුම්මවා ඇති, එපමණට ම මෝඩ අවුරුදු 9-11 පමණ වන සමහර ළමුන් මේ කොටසට අයත්ය. බොහෝවිට ඔවුන් සිටින්නේ තම උද්දච්ඡ දෙමාපියන් ද සමගය. ශිල්පියා මැජික් අංගයක් ඉදිරිපත් කිරීමට පෙර සිටම SAK කරන්න යන දේ සහ ඊළඟට සිදුවන දේ පිළිබඳව බොහොම විශ්වාසයෙන් එහෙත් නිවැරදි නොවන දේ කියමින්, අන් අයගේ අවධානය ලබාගන්නට උත්සාහ කරයි. පුත්‍රයා ගේ බුද්ධිය ගැන ආඩම්බර වන පියා තම ජාතකයේ උසස් බව ගැන මැජික් ශිල්පියා හට ඉඟි කරයි. කොලුවාටත් පියාටත් සිතාගත නොහැකි අංගයක් ඔබ ඉදිරිපත් කළහොත් පියා පුතාගෙන් එය පැහැදිලි කරන මෙන් ඉල්ලයි. පුත්‍රයාට පිළිතුරු නොහැකි වූවොත් ඇතිවන්නේ පිය-පුතු ගැටුමකි. එයට මැදිහත් නොවන්න. ඉවතට යන්නී

ජීවිතය ගැන කලකිරීමෙන් පසුවන වැඩිහිටි ජෝඩුවක් (Bored Couple - B.C.) දුටුවහොත් කල්පනාකාරී වන්න. ශතවර්ෂ ගණනාවකට පෙර යුග දිවියට ඇතුලත් වූ ඔවුනට එකිනෙකා සමග කතාකිරීමට තවත් කිසිවක් ඉතිරිව නොමැත. ඔවුන් රාත්‍රී භෝජනයට පිටතට පැමිණ ඇත්තේ කාලය කා දැමීමට හොඳම ක්‍රමය ලෙසය. තවත් මිනිසෙකු සමග කතා බහ කරන්නට ලැබීම ඔවුනට මහඟු අවස්ථාවකි. මැජික් තුලින් විනොදයක් ලැබීමත් සතුටකි. ඔවුන් සමග කතා කරමින් මැජික් පෙන්වමින් මුළු රාත්‍රියම ඔවුන්ගේ මේසයේ ගතකරනවා නම් ඒ තරමට ම ඔවුන් කැමතිය. ඔබට මැජික් පිළිබඳව ආසාවක් ඇතිවූ ආකාරය, ඔබේ මුල්ම මැජික් අංගය, ඔබේ මැජික් සංගමය, ප්‍රකට මැජික් ශිල්පීන් ගැන තොරතුරු, ඔබේ දරුවන් මැජික් කරනවාද ආදී විස්තර ඔබෙන් වීමසනු ඇත. ඔබට ඔබ ගැන ම අභිමානයක් ඇතිවී මේ කතා වලට පටලුනහොත් ගැලවීමක් නැත. එවන් එක් ප්‍රශ්නයකට පමණක් උත්තර දෙන්න. වහාම සමු ගන්න.

*Cont. on page 3*

# Annual General Meeting


**As the government has declared that Local Government elections will be held on 10th February 2018, the SLMC Board decided to re-schedule the Annual General Meeting which was originally fixed for Sunday the 11 February 2018 to Sunday the 18th of February 2018. Members in arrears of membership fees are urged to make payment without further delay.**

**Col. Ronald de Alwis**
**Secretary General**

# Resolutions

**The date for handing over of Resolutions to be tabled at the Annual General Meeting 2018 has been extended to 28th January 2018. They should reach Gen Sec Lt. Col. Ronald de Alwis by post or email.**

## Happy Birthday to all members celebrating their birthdays in January



| | |
|---|---|
| 1 | Vihan Perera |
| 1 | Haleem Ghouse |
| 8 | Elrae Pereira |
| 16 | Thusitha Jayasekera |



## Free Llunch

All Members attending the AGM will be provided free lunch as usual. Please inform your preference (Vegetarian, Fish or Chicken) on or before 16th Feb to the Secretary

*Cont. from page 2*

ඊ ළඟ මේසයට යන්න.
මෙවන් අවස්ථාවක ඔබට හමුවන බොහෝ දෙනෙක් මධ්‍යස්ත සුහද මිනිසුන් (Middle of the road lovelies - M'O'T'R'L') වීම වාසනාවකි. ඔවුහු දකින දේ අගය කරති. අවශ්‍ය තැනදී සිනහ වෙති; අත්පොලොසන් දී සතුට පළකරති. සමහර විට ඔබගේ දුරකථන අංකය සහිත ජ්රා පතක් ලබා ගනී. පසුව සංවිධාකයින් සමග කතා කරමින් ඔබව අගය කරති. ආචාරශීලි වන්න. අපගේ කලාව සහ කර්මාන්තය ඉදිරියට පවත්වාගෙන යාමට අවශ්‍යම කොටස ඔවුන්ය. ඔබේ හොඳම මැජික් අංගයන් ඔවුනට පෙන්වන්න. තව තවත් මැජික් දැකීමේ උනන්දුව ඔවුන් තුල වඩවන්න. ඔවුන් සතුටට පත් කිරීමට කළහැකි හැම දේ කරන්නී

අවසානයට 'සැබවින්ම මැජික් වලට ආදරය කරන්නෝ (True Magic Lovers - T'M'L') ගැන කතා කරමු. ඔවුන් සැබවින්ම මැජික් අගය කරන කණ්ඩායමයි. ඔවුහු මැජික් පිළිබඳව දනිති. මැජික් රහස් ද දනිති. ශිල්පය ප්‍රගුණ කිරීම පහසු නැති බව ද දනිති. ශිල්පීන්ට ආදරය කරති. ඔබව අගය කරති. හොඳ හෝ නරක හෝ ඔබ කරන සියළු දේ ඔවුහු අගයති. ඔ.එ.බ. කොටස උසස් රුචිකත්වයක් සහිත ඉතා ටික දෙනෙකි. ඔබ අප මෙන්ම මැජික් කලාවට සැබෑවටම ආදරය කරන ඔවුන් රැක ගන්නී

සැමවිටම සැම දෙනා වෙතම ආචාරශීලී වන්න. ඔබේ සේවා යෝජකයා මුදල් ගෙවා මැජික් ශිල්පියෙකු යොදවන්නේ තම පාරිභෝගිකයන් සතුටු කිරීමට විනා අපහසු තත්වයකට පත් කිරීමට නොවේ. එබැවින් ඔබේ ප්‍රේක්ෂකයා හඳුනාගෙන ඔහු 'සැමවිටම නිවැරදියි යන ආකල්පයේ පිහිටා ඔබගේ වෘත්තිය කරගෙන යන්න.
Good Luck

## *New Members*

There are several new members who need to take their oath and be enrolled to the SLMC. Please be present on 28th January to do so.

New Ord Members to Take Oath:

Danushka Gunaratne
Damian Shanushan
Kevin Fernando

Junior Members to Take Oath:

Inuka Mayakaduwa
Dulith Mayakaduwa
Nethun Wijesundara
Wega Damsinghe

## THANK YOU

A big thank you to all who helped me to publish the Wand during the last year. A special word of thanks to President Rohan, SG Ronnie, VP HDN and of course VP Asanka who looked in to the printing and dispatch. Hope we were able to provide you, our Readers a newsletter of value.
**Devsiri Fernando**
**Editor - WAND**

# WHO?



"I was born and raised in Australia and now live in Los Angeles where I'm a member of the Magic Castle.
My parents are Sri Lankan but sadly I have never been! We're finally planning a trip in April and I would love to visit the Magic Circle while I'm there."

**Who is this?**
**Keep reading the WAND for more details**

facebook

**Please visit our page on Face Book and give a 'LIKE'**
**https://www.facebook.com/srilankamagic/**





FISM organises the World Championship of Magic every 3 years. Since 1948 they have organized 25 events across the world. In 2018, 3000 magicians from across the globe will descend on Busan, Korea from the 9th – 14th July 2018. Will you be amongst them ?

When it comes to magic, people only care about two things:
**1.Being amazed**

and

**2.Having FUN!**



"Oh, I thought you knew. Sally was a magician's assistant."

## THE WAND

If undelivered please return to

Devsiri Fernando
No. 7, Francisco Place,
Moratuwa.